**Voice For Elephants Sri Lanka** is in Embekka, Sri Lanka.

9 November at 12:57 ·

**කඩුවෙල කොතලාවල සංකපිටිය විහාරයට හිමි කණ්ඩුල ( වීරා )හස්තියා පිලිබද කෙටි සටහනක්.......**

කුඩා කාලයේ ගලහා ප්‍රාදේශීයේ අතරමන්ව සිටියදී පින්නවල අලි අනාථාගාරය බාරයට ගනු ලැබුවා වූ මෙම හස්තියා පින්නවලදී හඳුන්වනු ලැබුවේ වීරා නමින්ය.පසුව මෙම හස්තියා පින්නවලින් ශ්‍රී ලංකා යුද හමුදා භාරකාරත්වයට ගැනින. 1984 සිට 1993 දක්වා වසර 09ක් ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කල මෙම හස්තියා යුධහමුදා නිළධාරින් හදුන්වනු ලැබුවේ කණ්ඩුල නමින් ය. කෙසේ වෙතත් වසර කිහිපයක් යුධ හමුදාවේ රැකවරණය ලැබූ මෙම හස්තියා යුධ හමුදාවේ නිලයක් පවා හිමි හස්තියෙක් වන්නේය . කෙසේ වෙතත් පසුව නැවතත් යුද හමුදාවෙන් පින්නවල අලි අනාථාගාරට භාරයට ගැණුනු මෙම හස්තියා වසර කිහිපයක් පින්නවල රැඳී සිටියේය.

පසුව විමල් වීරවංශ මහතාගේ මැදිහත් වීම මත ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 2012 වසරේ මෙම හස්තියා කඩුවෙල කොතලාවල සංඛපිටිය විහාරයට පූජා කරන්නට විය. පින්නවල රැඳී සිටින සමයේ තරමක නොසන්සුන් තාවයක් පෙන්නුම් කල මෙම හස්තියා ගේ භාරකාරත්වය හිමි වන්නෙ වසර 25 කටත් වඩා අලි ඇතුන් බලාකියා ගැනීමේ අත්දැකීම් ඇති හේරත් බණ්ඩා මහතාටය. වසර 17 ක් එක දිගට රංජිත් විජේසිංහ මහතාට හිමි ගජබා හස්තියා බලා කියා ගත්තේ ද හේරත් බණ්ඩා මහතා ය. ඉන් පසුව වීරා ගේ භාරකාරත්වය හිමිවන මොහු බලාකියා ගන්නා මෙම හස්තියා ලාංකීය හීලෑ අලි අතර වඩාත් හීලෑ අලියෙකු ලෙස හැඳින්වීමට පුලුවන. සංඛපිටිය විහාරයට ගෙන ආ දිනම විහාරස්ථානයේ විහාර මන්දිරයේ වහලය කඩා දැමීමට තරම් ප්‍රචණ්ඩ වූ මේ හස්තියා අද අලි ඇතුන් අතර හීලෑ බවින් අග තැන්පත් හස්තියෙකි.

මහනුවර දළදා මාලිගාවේ මෙන්ම ලංකාව පුරා විසිරී ඇති බොහෝ වෙහෙර විහාරස්ථානවල පෙරහැර කටයුතු සදහා සම්බන්ධ වන මේ හස්ති රාජයා අද වන විට පෙරහැර සංස්කෘතිය තුල බෙහෙවින් කතාබහට ලක් වන්නා වූ හස්ති රාජයෙක් වන්නේය.

සටහන : Voice for Elephants Sri Lanka

**........හස්ති රාජයාණෙනි ඔබ දී සායු........**



